

# බන්ධුල හරිශ්චන්ද්‍ර අභිනන්දන

**වසන්ත ශ්‍රීනාත් කුරුකුලසූරිය**









දසක හයක් යනු සුළු පටු කාලයක් නොවේ... පරම්පරා දෙකකි. ඒ සා විශාල කාලයක් රසිකයින් පිනවීමට යම් කලා කරුවෙකුට හැකි වේ නම් කුමන ක්ෂේත්‍රයක වුව එය ප්‍රාතිහාර්යයකි. රසිකයාගේ මහගු වාසනාවකි.

බන්ධුල හරිස්චන්ද්‍ර යනු ඒ සා විශාල කාලයක් රසිකයින් පාඨකයින් පිනවූ කලා කරුවෙකි. යුග පුරුෂයෙකි. ජාතියේ පිනට පහළ වූ අති දක්ෂ චිත්‍ර ශිල්පියෙකි. එතරම් කාලයක් ඔහුගේ මනරම් සිතුවම්, චිත්‍රකතා රස විඳි පාඨක රසික අපිද ඒ පිනෙහි කොටස් කරුවෝ වෙමු.

යුග දෙකක් තිස්සේ රසික අපට, රටට දුන් ඒ අපූර්ව නිර්මාණ වෙනුවෙන් ඔහු පෙරළා අපෙන් කිසිවක් බළාපොරොත්තු වූයේ නැ. මේ වෑයම ඔහු අපට රටට දායාද කළ දෙයින් අල්පමාත්‍රයක් හෝ පෙරළා නැවත ඔහු වෙනුවෙන් පුද කිරීමයි.

අපට පූර්වාදර්ශයක් වූ මේ මහා සිත්තරා වෙනුවෙන් අප සැමගේ ගේ කෘතගුණ දැක්වීමට යමක් කළ යුතු බව මා මුලින්ම සාකච්ජා කළේ සිඩ්නි හි වෙසෙන අනුර විතානගේ සොයුරා සමගිනි. ඒ පසුගිය වසරේදීය. අප දෙදෙනා විසින් බරපැන දමා හෝ ඔහුගේ අනාගත සුබ සිද්ධිය වෙනුවෙන් සුළුවෙන් හෝ යමක් කළ යුතු බව කතා වුණිද එය අපට ඒ මොහොතේ ක්‍රියාවට නැංවිය නොහැකි විය.

මීට මාස දෙකකට පමණ පෙර නැවතත් ඒ අවශ්‍යතාවය ප්‍රබල ලෙස මතුව ආවේ මෙල්බර්න් හි සිසිර දිසානායක සොයුරා ලංකාවට ගොස් කළ සංචාරයකදී බන්ධුල හරිශ්චන්ද්‍රයන් හමුවී කළ කතා බහත් බන්ධුල හරිශ්චන්ද්‍රයන් ගේ සමකාලීන තවත් ජනප්‍රිය චිත්‍ර කතා ශිල්පියකු වූ සරත් මධු ගේ වියෝවත් නිසාය.
නැවතත් මතකය අළුත් කර ගනිමින් අනුර සොයුරා සමගත් මෙල්බර්න් හි සිසිර හා ජගත් ජේ එදිරිසිංහ සොයුරන් සමගත් සාකච්ජා කොට මා ලංකාවේ නිරූන් බුද්ධසිරි සොයුරාට ඇමතුමක් ගත්තේ මේ අතිදක්ෂ සිත්තරාට බුහුමන් දැක්වීම සංවෘත ස්ථානයකින් බැහැරව ඔහුගේ පාඨක රසිකයින් මධ්‍යයේ කිරීමට ඉඩ ප්‍රස්ථාවක් සොයාගැනීමේ අටියෙනි.




හැරෙන් තැපෑලෙන් මට ඔහුගෙන් සුබවාදී පිළිතුරක් ලැබුණි. . දින දෙකක් ඇතුලත ශාලාව ඇතුළු බොහෝ දේ සංවිධානය වුණි.

බන්ධුල හරිශ්චන්ද්‍ර අභිනන්දන උළෙල 2019 මූලික කටයුතු ඇරඹුනේ එලෙසයි.

බන්ධුල හරිශ්චන්ද්‍ර අභිනන්දන උපහාර උළෙල සාර්ථක කර ගැනීමේ ලා මේ වන




විට බොහෝ සහෘදයින් එක්වී සිටින අතර ඔවුන් හඳුන්වාදීම ඉදිරියේදී මා අතින් සිදුවනු ඇත.

මේ වෙනුවෙන් තව එක් මහඟු කර්තව්‍යයක් මෙන්ම අභියෝගයක් අප ඉදිරියේ ඇත.

මේ සා රසික පාඨක ඔබ අප රසවත් කළ අපගේ බුද්ධියට ඇමතූ අතිශය දුර්ලභ කලා කරුවකු වුවද ශ්‍රී ලංකාවේ පවතින ආර්ථික රටාව තුල ඔහු කෙතරම් අනාරක්ෂිතදැයි ඔබට අමුතුවෙන් පැවසිය යුතු නැත. නූගත් ඔළමොට්ටල,තුට්ටු දෙකේ දේශපාලකයින් රටෙහි සාරය උරා බොමින් සුපිරි ජීවිත ගත කරද්දී මෙවැනි කෘතහස්ත කලාකරුවන් ගේ අනාගතය වෙනුවෙන් රජයේ විශ්‍රාම වැටුප් ක්‍රමයක් හෝ වෙනත් කිසිදු වැඩ පිළිවෙලක් නැත.

ටවර් හෝල් රඟහල පදනමෙන් කලා කරුවන් හට සොච්චම් මුදලක් ලැබෙන නමුත් එය ලබා ගැනීමට නම් චිත්‍රකතා කලාව අතහැර වෙනත් කලාවක් තෝරා ගත යුතුය.
එම නිසා චිත්‍රකතා ශිල්පීන් සහ චිත්‍රකතා ලෝලීන් වශයෙන් අප සතු යුතුකමක් ඇත.

එය නම් බන්ධුල හරිශ්චන්ද්‍ර වැනි කෘතහස්ත කලාකරුවකුට ජීවිතයේ සැඳෑසමය අභිමානවත් ලෙස ජීවත් වීමට තව තවත් සොඳුරු නිර්මාණ බිහි කරලීමට අපද සුළුවෙන් හෝ අඩිතාලමක් දමා දීමයි.

ඒ සඳහා, චිත්‍රශිල්පී පාඨක රසික ඔබ සැමගේ නොමසුරු සහයෝගය බලාපොරොත්තු වන අතර ඔබට හැකි අයුරින් මේ සද්කාර්යයට සම්මාදම් වන ලෙස ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමි.




ඒ වෙනුවෙන් පිළියෙල කෙරුණු ගිණුම් අංකය මා පහතින් දක්වා ඇත. මෙම ගිණුමට ඔබ බැර කරන මුදල් පිළිබඳව ඉන්බොක්ස් කිරීමෙන් අපද දැණුම්වත් කරන්නේ නම් එය අපට පහසුවක් වනු ඇත.

Name - Mr. DOMPAGE BANDULA HARISCHANDRA PEIRIS
Acct. No. - 8001510948
Bank - COMMERCIAL BANK
Branch - PILIYANDALA

ඔබ සැමට ස්තුතියි.

